මාධ්‍ය ඔස්සේ සමාජගත කෙරෙනා භාෂාව ශිෂ්ට සම්පන්න වන තරමට, එම ජනසමාජයේ ආකල්ප සහ චින්තනයද ශිෂ්ට සම්පන්න වනු ඇතැයි යන්න අප විසින් මින් පෙර දිගින් දිගටම සංවාදයට ගෙන ඇත්තෙමු.

මෙම ශිෂ්ට සම්පන්න භාෂා භාවිතයක එක් ආකාරයක් වන්නේ විවිධ විදේශීය ජාතීන් හැඳින්වීමේදී වඩාත් ශිෂ්ට සම්පන්න යෙදුම් භාවිතා කිරීමයි. උදාහරණයක් ලෙසින් ගතහොත්, 'චීනුන්', 'චීන්නු' වැනි යෙදුම් වලට වඩා යෝග්‍ය වන්නේ 'චීන ජාතිකයන්' වැනි යෙදුමක් නොවන්නේද? එසේම 'චීනා', 'චීන්නු' වැනි නිෂේධනාත්මක යෙදුම් ඔස්සේ ජනිත වන අවමානාත්මක හෝ කොන් කිරීමේ ස්වරය, යම් ජාතියක් කෙරෙහි වන විදේශික භීතිකාවක් (xenophobia) ඇති කිරීමට පවා හේතු නොවනු ඇතිද?

**#MediaEthicsSL #lka #SinhalaPress #Divaina #Dinamina #Aruna**